# කැලණිය විශ්වවිද්‍යාලයීය ආදිවිද්‍යාර්ථීන්ගේ සංසදය

## ජෝ. පෙරේරා

රත්මලානේ ශ්‍රී ධර්මාලෝක නා හිමියාණන් විසින් 1875 නොවැම්බර් මස 01 වන දින කැලණිය පැලියගොඩ ආරම්භ කළ විද්‍යාලංකාර පිරිවෙන 19 වන සියවසේ දෙවන භාගයේදී ප්‍රාචීන භාෂා ශාස්ත්‍රාධ්‍යාපනයෙන් අග්‍ර ස්ථානයක වැජඹුන උසස් විද්‍යායතනයකි. මෙම පිරිවෙන 1959 ජනවාරි මස 01 වන දින විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය බවට පත් කිරීම එවකට පැවති අග්‍රාමාත්‍ය එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ රජයෙන් මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය පිණිස දියත් කරන ලද ශ්‍රේෂ්ඨ පියවරක් ලෙස සැලකිය හැකිය.

1972 අංක 01 දරන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පනත මගින් ශ්‍රී ලංකාවේ සියලුම විශ්වවිද්‍යාල එකම විශ්වවිද්‍යාලයක් බවට පත් කරනු ලැබූ අවස්ථාවේ 1972 පෙබරවාරි මස 15 වන දින මෙම විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපය බවට පත් විය. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් 1978 දී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව ලෙසින් හැඳින වරක් ස්වායත්ත විශ්වවිද්‍යාලයක් බවට පත් කරනු ලැබිණ.

1957 පනත අනුව ආරම්භයේදී ගිහි පැවිදි ශිෂ්‍යයන් පමණක් ඇතුලත් කරගනු ලැබුනු මෙම ආයතනයට 1966 දරන අංක 20 දරන ජාතික උසස් අධ්‍යාපන පනත ක්‍රියාත්මක කරනු ලැබීමත් සමගම ශිෂ්‍යාවන් ද ඇතුලත් කරගත හැකි විය.

මෙම විශ්වවිද්‍යාලය ආරම්භ කරනු ලැබුණු 1959 දී එය ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර, භූගෝල විද්‍යාව, බෞද්ධ අධ්‍යනය හා දර්ශනය, ආර්ථික විද්‍යාව, ගණිතය හා අධ්‍යාපන විද්‍යාව වැනි විෂය කීපයකට පමණක් සීමා වුවද එය